(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 13(5).]

# පාර්ලිමේන්තුවේ අංක 13 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා**

## 2015 මාර්තු මස 04 වැනි බදාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5768/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කඩහපොල - රඹාවැව මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ වන මාර්ගයේ දුර සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදිකිරීම සඳහා වන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, අගතියට පත්වන පාර්ශ්වකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් වී ඇති අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5858/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට රට තුළ දෛනිකව භාවිතා කරන ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් යන ඉන්ධන වර්ගවල සාමාන්‍ය අගය ලීටර් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් ඉන්ධන වර්ගය සඳහා දැනට අයකරන බදු ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි කාලය තුළ ජනතාවට සහනයක් ලැබෙන පරිදි එකී බදු ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ අනුව එම එක් එක් ඉන්ධන ලීටරයක් සඳහා නියමිත වෙළඳපොළ මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මාර්තු මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4784/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ වන අලි නිසා සිදුවන මිනිස් ජීවිත හානි සංඛ්‍යාව අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග කවරේද;

(ii) වන අලින්ගෙන් ආරක්ෂා වීම සඳහා මුළු දිවයිනටම අවශ්‍ය වී ඇති විදුලි වැටවල (අලි වැටවල) දිග ප්‍රමාණය පිළිබඳ දැනුවත් භාවයක් තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය විදුලි වැටවල දිග ප්‍රමාණය කොපමණද;

(v) විදුලි වැට ඉදිකිරීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5447/'14

ගරු අනුර දිසානායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006.01.01 දිනට පෙර විශ්‍රාමලත් රජයේ සේවකයින්ගේ වැටුප් විෂමතාවය ඉවත් කරන බවට 'ආදරණීය ජ්‍යෙෂ්ඨ පුරවැසියනි' යන හිසින් යුතුව, රජය මගින් දැන්වීමක් පළ කරනු ලැබුවේද;

(ii) 2010 පැවැති ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපතිවරයාගේ අත්සන සහිතව පළකර තිබූ එම දැන්වීමේ පහළින් 'මම කියන දේ කරන, කරන දේ කියන කෙනෙක් වෙමි.' යනුවෙන් සඳහන් වූ නමුත්, එම වැටුප් විෂමතාවය මේ දක්වා ඉවත් නොකිරීමට හේතු කවරේද;

(iii) මේ පිළිබඳව 2012.11.29 වැනි දින පාර්ලිමේන්තුවේ නැගූ ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමින් ඉතා ඉක්මනින් එම වැටුප් විෂමතාවය ඉවත් කරනු ඇති බවට ප්‍රකාශයක් කළ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට කටයුතු කරන දිනය කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5769/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල - කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ මාර්ගයේ දුර සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදිකිරීම සඳහා වන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අගතියට පත්වන පාර්ශ්වකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5774/'14

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, හොරවල උප කාර්යාල සීමාව තුළ හොරවල, දියකිතුලගොඩවත්ත, මතුගම - අළුත්ගම පාරට මුහුණලා පිහිටි අමරපාල ජයනෙත්ති මහතාට අයත් පර්චස් 2.8ක කුඩා ඉඩමේ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලැස්ම අනුමතකර ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසු අවට නිවෙස්වලට ගමන් කරන මාර්ගයට හා අසල ඉදිකර ඇති ගොඩනැගිලිවලට අවහිරතා ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම රජයේ නීති රීති අනුව සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ගොඩනැගිලි සැලැස්මට අනුමතිය ලබා දී ඇති ක්‍රියා පිළිවෙත කවරේද;

(iii) එම අනුමතිය කිනම් පාර්ශ්වයක අවශ්‍යතාවය මත සිදු කර තිබේද;

(iv) රජයේ නීති රීති අනුව නිවසක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවසරය ලබා දීම සඳහා තිබිය යුතු අවම බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.261/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.262/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.263/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.264/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමඟ පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 304/'15

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු දි. මු. ජයරත්න මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු පී. දයාරත්න මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා

ගරු ජගත් බාලසූරිය මහතා

ගරු ජීවන් කුමාරණතුංග මහතා

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු ඩිව් ගුණසේකර මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සරණ ගුණවර්ධන මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය

ගරු ෆීලික්ස් පෙරේරා මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු රුවන් රණතුංග මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු සී. පී. ඩී. බණ්ඩාරනායක මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු වී. කේ. ඉන්දික මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු දයාශ්‍රිත තිසේරා මහතා

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු පී. පියසේන මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු ප්‍රභා ගනේසන් මහතා

ගරු විජය දහනායක මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු ජයසිංහ බණ්ඩාර මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතාට එරෙහි විශ්වාස භංගත්වය,—

නීතිය හා සාමය සුරැකීමේ වගකීමත් හා නීතිය සෑම පුරවැසියාටම සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීමත්, නීතිය ක්‍රියාත්මක කිරීමේදී පක්ෂග්‍රාහීත්වයෙන් තොරව පොලීසිය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යන ආයතන නිසි ලෙස මෙහෙයවීමෙන් දේශපාලන පක්ෂ භේදයන්ගෙන් හෝ පුද්ගලයින්ගේ තරාතිරම්වලින් තොරව නීතිය ක්‍රියාත්මක කරවීමේ වගකීමත්, එසේ නීතිය ක්‍රියාත්මක නොකරන්නේ නම්, එවැනි නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමේ වගකීමත් පැවරෙන මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ වර්තමාන අමාත්‍යවරයා වන ගරු ජෝන් අමරතුංග මහතා,—

(අ) සිය ධූරය භාරගත් දිනයේ සිට මේ දක්වා තමා වෙත පැවරුණු එකී වගකීම් සාධාරණ හා අපක්ෂපාතී ලෙස ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී ඇති බව පැහැදිලිව පෙනී යන හෙයින්ද;

(ආ) ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාශ රාශියක ශ්‍රී ලංකා නිදහස් පක්ෂිකයින් ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හා අහිංසක වෘත්තීය සමිතිවල නායකයින්ට හා ක්‍රියාකාරීන්ට එරෙහිව විරුද්ධ දේශපාලන පක්ෂ ආධාරකරුවන් හා ප්‍රාදේශීය නායකයින් විසින් දියත් කරන ලද ප්‍රචණ්ඩත්වය තුළින් සිදුවූ ජීවිත හානි, ශාරීරික හානි හා දේපළ හානි පිළිබඳව නිසි ලෙස පරීක්ෂා කොට, චූදිතයින් අධිකරණය හමුවට ගෙන ඒමට පොලීසිය ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන මෙහෙයවීම පැහැර හරිමින්, පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බව පැහැදිලිව පෙනෙන හෙයින්ද;

(ඇ) අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතා වත්තල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම පැවැත්වූ 2015 ජනවාරි 30 වැනි දින එම ස්ථානයට පැමිණ, පිළිගැනීමේ රැස්වීමක් පැවැත්වීමේ ස්වරූපයෙන් එක්සත් ජාතික පාක්ෂිකයින් එම ස්ථානයට කැඳවා, ඔවුන් කුපිත කරවන කථාවන් පැවැත්වීමට සලස්වා, ඉන් අනතුරුව මැරවරයින් පිරිසක් ප්‍රාදේශීය සභාවේ රැස්වීම පැවති සභා ගර්භයට නීති විරෝධී ලෙස, බලහත්කාරයෙන් ඇතුල් වී, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපතිවරයා ඇතුළු

මන්ත්‍රීවරුන්ට පහරදී, ඔවුන් රෝහල් ගතකරන ලද මෙම සිද්ධිය සම්පූර්ණයෙන්ම උසස් පොලිස් නිලධාරීන් නිහඬව බලා සිටියදී සිදුවූ බව පැහැදිලිවම තහවුරු වී ඇති නිසා මෙවැනි බරපතල සිද්ධියක් ගරු ජෝන් අමරතුංග අමාත්‍යතුමා දේශපාලන නායකත්වය ලබා දෙන වත්තල මැතිවරණ කොට්ඨාශය තුළ සිදුවූයේ එතුමාගේ වක්‍ර සහයෝගය හා අනුබලය නිසා බව පැහැදිලිවම පෙනෙන හෙයින්ද, එයට අදාළව නීති විරෝධී ක්‍රියාවල නිරත වූ මැරවරයින් අත්අඩංගුවට ගෙන යථා පරිදි කටයුතු කිරීමට පොලීසිය අපොහොසත් වූ හෙයින්ද, විශේෂයෙන් අධිකරණයට ඉදිරිපත් කරන ලද සමහර සැකකරුවන් එදිනම ඇප මත මුදා හැර ඇති බව වාර්තා වන හෙයින්ද, මෙවැනි බරපතල අපරාධවල නිරත වූ සැකකරුවන් එසේ වහාම ඇප මත මුදාහරින ලද්දේ දේශපාලන බලපෑම් මත බව පැහැදිලිව පෙනෙන හෙයින්ද;

(ඈ) තලවකැලේ පොලිස් වසමේ, ග්‍රේට් වෙස්ටන් ගල්කන්දවත්තේ විසූ මනෝජ් නමැති පුද්ගලයා තලවකැලේ පොලීසිය විසින් අනවශ්‍ය ලෙස ලුහුබැඳීම නිසා බියට පත්වී ජලාශයට පැන මිය ගිය අවස්ථාවේදී පොලීසිය නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවූ බව පැවසූ විට, අහිංසක වතු කම්කරු ජනතාවගෙන් පලිගැනීමේ චේතනාවෙන් පොලීසිය ක්‍රියාත්මක වන අවස්ථාවේ අමාත්‍යාංශයේ ප්‍රධානියා වශයෙන් ගරු ජෝන් අමරතුංග මහතා ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය නොකර, එය පසෙක තබා මේ සිද්ධිය සම්බන්ධයෙන් උද්ඝෝෂණ කළ අහිංසක වතු කම්කරු ජනතාව මේ වනවිටත් අත්අඩංගුවට ගනිමින් සිටින බැවින්, ඔවුන් තවදුරටත් පීඩාවට ලක්ව ඇති හෙයින්ද;

(ඉ) මීට අමතරව උසාවිවල විනිසුරුවන් පවා සිය විනිශ්චය ආසනවලින් බලහත්කාරයෙන් ඉවත් කිරීමට පෙළඹවූ පුද්ගලයින්ට එරෙහිව පියවර ගැනීමට පොලීසිය අපොහොසත් වූ නිසා මෙවැනි සිද්ධීන් ගණනාවක් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වී ඇති අතර, මෙම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ ඇති පොලීසිය ක්‍රියා කර ඇති ඉතා ඇල්මැරුණ තත්ත්වය මෙම සාහසික ක්‍රියාව පිළිබඳව පියවර නොගත් බව පැහැදිලිවම පෙනී යන හෙයින්ද, සමස්තයක් ලෙස රටේ බොහෝ ප්‍රදේශයන්හි නීතියේ ආධිපත්‍ය බිඳ වැටී, කැලෑ නීතිය රජ කරන යුගයකට අවතීර්ණ වන බවක් පෙනී යන හෙයින්ද, සමහර පොලීසි මගින් පීඩාවට පත් වූ පුද්ගලයින්ගේ පැමිණිලි භාර ගැනීම පවා ප්‍රතික්ෂේප කර ඇති බවට තොරතුරු ලැබී ඇති හෙයින්ද;

මෙකී සමස්ත කාරණා සැලකිල්ලට ගැනීමේදී මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු විෂය භාර අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතා පක්ෂග්‍රාහී ලෙස කටයුතු කර ඇති බවත්, නීතිය හා සාමය රැකීම සඳහා අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගැනීමට නායකත්වය ලබා දීමට අපොහොසත් වී ඇති බවත්, විපක්ෂ දේශපාලන ක්‍රියාකාරීන්ට එරෙහිව කරන ලද අඩන්තේට්ටම්වලදී නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කරවීමට අපොහොසත් වී ඇති බවත් පැහැදිලිවම පෙනී යන හෙයින්ද;

මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතාට තවදුරටත් මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.